## 20 පාඩම 11 කොටස
## 7 ශ්‍රේණිය – සිංහල
## සකස් කඩ නොකී කට
## එම්.ඩී.ආර්.මුණසිංහ

1. පහත සඳහන් කතන්දරය ශබ්ද නගා කියවන්න.

ඔන්න එකෝමත් එක රටක හිටිය යකින්නක්. ඒ යකින්න ළමයින්ට හරිම ආදරෙයි. ඒත් යකින්නක් හින්ද ළමයි නම් හරි බයයි. එක දවසක් ඒ ගමට ආව බිල්ලෙක්. ගමේ හැම දෙනා ම මේ ගැන තමයි කතා කළේ. මෙහෙම ටික දවසක් ගත වුණා. බිල්ලා ගැන කතාවත් නැති වුණා. මේ අතර ගමේ ළමයි එක්කෙනා දෙන්න අතුරු දහන් වුණා. මිනිස්සු හිතුව බිල්ලො ළමයි ඇරන් ගියා කියල. මිනිස්සු ළමයින් ව හැමතැන ම හෙව්ව. මෙහෙම හොයන කොට කැලේ ගල් ගුහාවක ඉඳල ළමයි ටික හම්බුණා. ඒ විතරක් නෙවෙයි. බිල්ලෙකුත් හම්බුණා. වෙලා තියෙන්නෙ මේකයි. බිල්ලො ළමයි ඇරන් යනකොට යකින්න ළමයි ටික බේරගෙන ඉතිරි බිල්ලො ටික කාල. එදායින් පස්සෙ යකින්නට ගමේ හැම දෙනා ම කැමති වුණා.

2. පහත සඳහන් කොටස් සුදුසු විරාම ලක්ෂණ යොදමින් දෙබසක් ලෙස පෙලගස්වා ලියා, ශබ්ද නගා කියවන්න.

ඔන්න ඔහෙ හිටිය පුතේ/ ඔව් ඔව් දැන්මම යමු /අපේ අනික් යාළුවන්ටත් කියමු / ඇයි මේ එළියෙ ඉන්නෙ. වරෙන් ගෙට/ නැන්දේ කෝ නිමල්/ ඒක නෙවෙයි අපි කවද්ද දන්සලේ වැඩ පටන්ගන්නෙ/ එහෙනම් අපි වැඩ පටන් ගමු/ආ..ං මේ කසුන්නෙ/ ආත නම් කිව්ව හෙට සුබ වැඩවලට හොඳ දවසක් කියල./

**3.** පෙල පොතේ 155 පිටුවේ රෝස පාටින් අංකිත ඡේද දෙක ශබ්ද නගා කියවන්න. එය පටිගත (Voice Record) කර අසා, හඬනගා කියවීමේ ලක්ෂණ සමග සසඳා, අඩුපාඩු ඇතොත් නැවත කියවන්න.

(වැඩිහිටියන්ගේ සහාය ලබා ගන්න)